## මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම. |
| වයස | : | අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | UMT 1 (III) - රු. 51,095 - 7 X 540; 10 X 640 - 60,575(මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

### 02. මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත් විය යුතුය. |
| වයස | : | අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | UMT 1 (III) - රු. 51,095-7 X 540; 10 X 640 - 60,575/- (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

**03. රියදුරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 1. | අ.පො.ස (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වීම. |
| | | සහ |
| | 2. | මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබීම . |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය. |
| | | (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය. |
| | | (iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| | | අයදුම්කරු විසින් මෑතකදී ලබාගත් පොලිස් වාර්තාවක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය. |
| වැටුප් ක්‍රමය | : | U-PL 3 (III) - රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික) |
| | | (කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**04. පෙදරේරු /ජලනල කාර්මික /පැස්සුම්කරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරකට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | UPL 3 (III) රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික) U-PL 3 (III) කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ. |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**05. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)**

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | 1. (i) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ඉහත තනතුරට අදාල ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. |
| | හෝ (ii) | අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය. |
| වයස | : | අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. |
| වෙනත් | : | (i) ශ්‍රී ලංකික පුරවැසියකු විය යුතුය.<br>(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.<br>(iii) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.<br><br>අයදුම්කරු සතුව අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද G1 කාණ්ඩයේ වලංගු රියදුරු බලපත්‍රයක් හෝ තිබිය යුතුය. |
| වැටුප් ක්‍රමය | : | U-PL-2 (III) රු. 44,575-16x490-52,415 (මාසික)<br>(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.) |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

** මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අනුමත දීමනාවන්ද ගෙවනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්, සහතික කරන ලද සහතිකවල පිටපත් ද සහිතව 2026.03.06 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරි/ආයතන (අනධ්‍යයන) මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් මොරටුව විශ්වවිද්‍යාලයේ https://uom.lk/vacancies.වෙබ් අඩවිය මගින් බා ගත කල හැක.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාතර්මේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාතර්මේන්තු ප්‍රධානීන් මගින් එවීමට කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි අදාල දෙපාතර්මේන්තු ප්‍රධානීන් මගින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරි,<br>
මොරටුව විශ්වවිද්‍යාලය,<br>
මොරටුව.<br>
2026.02.11